# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විදුලි සංදේශ බදු (සංශෝධන)

**2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2014 මාර්තු මස 21 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2014 මාර්තු මස 10 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[296 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 008073—525(2014/03)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

**විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත.**

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් 2013 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, 2014 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන කාලය සඳහා විදුලි සංදේශ බදු අනුප්‍රමාණය සියයට විස්සේ සිට සියයට විසි පහ දක්වා ප්‍රතිශෝධනය කිරීම වේ.

***3 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ඉන්වොයිසි නිකුත් කිරීමට පෙර හෝ ඉන්වොයිසි නිකුත් කිරීමකින් තොරව බදු මුදල් එකතු කරනු ලබන අවස්ථාවන් සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, බදු මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ඉඩ දී ඇති කාලසීමාව අඩු කිරීම වේ.

***5 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, පොදු දුරකථන කුටි සේවා සැපයීමට බලය පවරා ඇති ක්‍රියාකරුවන් බදු ගෙවීමෙන් බැහැර කිරීම වේ.

# විදුලි සංදේශ බදු (සංශෝධන)

එල්.ඩී.—ඕ. 8/2014.

**2011 අංක 21 දරන දරන විදුලි සංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

**1.** මේ පනත 2014 අංක දරන විදුලි සංදේශ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය සියලු කාර්ය සඳහා 2014 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

*2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**2.** 2013 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ 2 වන වගන්තියේ "(අ) 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භවන" යන වචන සහ ඉලක්කම්වල සිට "විදුලි සංදේශ සේවා සැපයුමේ අගය මත පනවා අයකර ගත යුතුය." යන වචන දක්වා වූ සියලු වචන හා ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"(අ) 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන එහෙත් 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ කාලය සඳහා සියයට විස්සක් වූ අනුප්‍රමාණයකින් ද ;

(ආ) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2014 ජනවාරි මස 1 වන දිනට පෙරාතුවම වූ කාලය සඳහා —

(i) අන්තර්ජාල සේවා සැපයුමේ අගය මත සියයට දහයක් වූ අනුප්‍රමාණයකින් ; සහ

(ii) අන්තර්ජාල සේවා සැපයීම නොවන විදුලි සංදේශ සේවා සැපයුමේ අගය මත සියයට විස්සක් වූ අනුප්‍රමාණයකින් ද ;

2—PL 008026—475 (2014/03)

(ඇ) 2014 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් කාලසීමාවක් සඳහා ;

(i) අන්තර්ජාල සේවා සැපයුමේ අගය මත සියයට දහයක් වූ අනුප්‍රමාණයකින් ; සහ

(ii) අන්තර්ජාල සේවා සැපයීම නොවන විදුලි සංදේශ සේවා සැපයුමේ අගය මත සියයට විසි පහක් වූ අනුප්‍රමාණයකින් ද වූ,

විදුලි සංදේශ බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් එක් එක් මාසය සම්බන්ධයෙන් එම විදුලි සංදේශ සේවා ලැබීමේ දී ක්‍රියාකරු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා සැපයුමේ අගය මත පනවා අයකරගනු ලැබිය යුතු ය:";

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ "කොමිෂන් සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"කොමිෂන් සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුවද, ඉන්වොයිසි නිකුත් කිරීමට පෙර හෝ ඉන්වොයිසි නිකුත් කිරීමකින් තොරව එම බද්ද අයකරගනු ලබන අවස්ථාවක, එම බද්ද-

(අ) යම් මාසයක 1 වන දිනයෙන් ආරම්භව එම මාසයේ 15 වන දින දක්වා වන කාලය සඳහා එකතුකර ගනු ලබන විට, එම මාසයේ 20 වන දින හෝ එදිනට පෙර ගෙවනු ලැබිය යුතු ය ; සහ

(ආ) යම් මාසයක 16 වන දිනයෙන් ආරම්භව එම මාසයේ අවසානය දක්වා වන කාලය සඳහා එකතු කරගනු ලබන විට, පසුව එළඹෙන මාසයේ 5 වන දින හෝ එදිනට පෙරාතුව ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ "බද්ද ලැබීමෙන් දින හතක් ඇතුළත" යන වචන වෙනුවට "බද්ද ලැබීමෙන් දින පහක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ "ක්‍රියාකරු" යන වචනයේ අර්ථනිරූපනය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථනිරූපනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ක්‍රියාකරු" යන්නෙන්, පොදු දුරකථන කුටි සේවාවක් සැපයීමට පමණක් බලය ලබා ඇති ක්‍රියාකරුවකු හැර 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍ර ලැබූ ක්‍රියාකරුවකු අදහස් වේ.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ බලය දෙන ලද යම් ක්‍රියාකරුවකු විසින් යම් ග්‍රාහකයකුගෙන් 2014 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2014 මාර්තු මස 31 වන දිනයෙන් අවසන්වන කාලසීමාව තුළ දී මෙම පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි විදුලි සංදේශ බද්ද අයකර එකතු කරන අවස්ථාවක දී එම බද්ද සියලු කාර්යය සඳහා වලංගු ලෙස අයකර එකතු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය:

වලංගු කිරීම.

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත කී විධිවිධාන එකී කාලසීමාව තුළ දී අයකර එකතු කරනු ලැබූ එම බදු මුදල් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් නිකුත් කරන ලද යම් තීරණයකට හෝ ආඥාවකට හෝ යම් අධිකරණයක විභාග වෙමින් පවතින නීති කෘත්‍යයකට බල නොපෑ යුතු ය.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.